ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක් - **LWU 1411**

කාලය - පැය තුනයි.

---

දිනය -2007.03.09 වේලාව - පෙ.ව.10.00 -ප.ව.01.00 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>*

01. "බ්‍රිතාන්‍යයන් සිය යටත් විජිත පාලනය කරනු ලැබුවේ ස්ථාපිත පරිපාලන රීති සම්ප්‍රදායකට අනුවය. එවැනි එක් රීතියක් වූයේ, බ්‍රිතාන්‍යයන් විසින් යම් යටත් විජිතයක් අල්ලා ගැනීමට පෙර එම යටත් විජිතයේ පැවති නීති සහ ආයතන දිගටම පවත්වාගෙන යා යුතු වීමයි. මේ අනුව ශ්‍රී ලංකාවේ අදාළ කරගෙන ඇති බවට සලකන ලද සියලු ලන්දේසි ව්‍යවස්ථා බලාත්මක කරමින් අධිකරණය සිය වගකීම ඉෂ්ඨ කරන ලදී."

ව්‍යවස්ථා සහ නඩු තීරණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෙම ප්‍රකාශනය විවේචනාත්මකව විභාග කරන්න.

02. ජයන්ත මහනුවර මහරෝහලෙහි වෛද්‍යවරයෙකු විය. ඔහුගේ දෙමාපියන් මාතලේ ස්ථිර පදිංචිකරුවෝ වූහ. ඔහුගේ පියා පහතරට සිංහල පවුලකින් පැවත එන්නෙකු වූ අතර වර්ෂ 1951 දී උඩරට කාන්තාවක් වූ ජයන්තගේ මව සමග බින්න විවාහයක් කරගෙන තිබුණි. ජයන්ත එම රෝහලෙහිම වෛද්‍යවරියක වූ සඳුනි සමග පෙමින් බැඳුනේ ය. ඇගේ පියා දකුණු පළාතේ පවුලකින් පැවත එන්නෙකු වූ අතර උඩරට කාන්තාවක වන සඳුනිගේ මව විවාහ කරගෙන තිබුණි. වර්ෂ 1960 දී ඇගේ මව සහ පියා සාමාන්‍ය නීතිය යටතේ විවාහය ලියාපදිංචි කර තිබුණු අතර සඳුනිගේ පියා ඔහුගේ වියදමින් ඉදිකරන ලද මහනුවර නව නිවසේ පදිංචි වූහ.

ජයන්ත සහ සඳුනි ඔවුන්ගේ විවාහය උඩරට නීතිය යටතේ ලියාපදිංචි කිරීමට අදහස් කරයි.

අ. සඳුනි සහ ජයන්තට සිය විවාහය උඩරට නීතිය යටත් ලියාපදිංචි කළ හැකි ද?

ආ) සඳුනිගේ පියා වර්ෂ 1950 දී තම විවාහය ඇගේ මව සමග බින්න විවාහයක් වශයෙන් උඩරට නීතිය යටතේ ලියාපදිංචි කර තිබුණි නම් ඔබගේ පිළිතුර වෙනස් කෙරේද?

ව්‍යවස්ථා සහ අධිකරණ තීරණ ආශ්‍රයෙන් ඔබගේ පිළිතුර සාකච්ඡා කරන්න.

03. ද්‍රවිඩ දෙමාපියන්ට දාව සෙල්වම් 1976 ඕස්ට්‍රේලියාවේදී උපන්නේය. ඔහුගේ දෙමාපියන් යාපනයේ ද්‍රවිඩ අය වූහ. ඔහුට වයස අවුරුදු හතේදී ඔහුගේ දෙමාපියෝ යළි ලංකාවට පැමිණ යාපනයට ගියහ. ඔහුගේ පාසල් අධ්‍යාපනය යාපනයේ පාසලකින් ලබා ගන්නා ලදී. වර්ෂ 1996 දී ඔහු ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුළත් විය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු ඔහු තාවකාලික කථිකාචාර්යවරයෙකු ලෙස එම විශ්වවිද්‍යාලයේම අධ්‍යයන කාර්ය මණ්ඩලයට සම්බන්ධ විය. කොළඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක වූ මන්දිරා සමග වර්ෂ 2001 දී සෙල්වම් විවාහ විය. ඇය යාපනය ප්‍රදේශයේ තැනැත්තියක වූ අතර ඇගේ දෙමාපියෝ ද ද්‍රවිඩ අය වූහ. විවාහයෙන් පසු ඔවුහු වාසය කලේ මන්දිරාගේ දෙමාපියන් විසින් ඔවුනට තෑගි දෙන ලද දෙහිවල නිවසකය.

එම විවාහය කරණකොට ඔවුනට ජයකුමාරි නම් දැරියක ලැබුණි. වර්ෂ 2003 දී ජයකුමාරි ඉපදීමෙන් පසු සෙල්වම් සිය පවුල යාපනයට ගෙනයාමට තීරණය කළේය. පවුල යාපනයට ගිය පසු රැකියාවෙන් ඉවත් වූ මන්දිරා සෙල්වම්ගේ දෙමාපියන් සමග ජීවත් වූවාය. යාපනයේ ප්‍රසිද්ධ බාලිකා පාසලකට ජයකුමාරි ඇතුළත් කරන ලදී. සෙල්වම් ඔවුන්ව බැලීමට යාමට පුරුදුව සිටියේය. වර්ෂ 2004 දී සෙල්වම් යාපනයේ නව නිවසක් ඉදි කල අතර මන්දිරා සමග එම නිවසේ වාසය කිරීමට පැමිණෙන ලෙස තම දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටියේය. ඔහු යාපනය විශ්වවිද්‍යාලයට මාරු වී යාමට බලාපොරොත්තුවෙන් සිටි නමුත් එය අසාර්ථක විය. සෙල්වම් දෙහිවල ගොඩනැගිල්ලක් අත්කරගත් අතර උසස් පෙළ සිසුන් සඳහා පෞද්ගලික පන්ති ආරම්භ කළේය. සෙල්වම් එම පෞද්ගලික පන්තිවලින් ලාභයක් ඉපැයූ අතර ඉන් කොටසක් කොළඹ පිහිටි මූල්‍ය සමාගමක ආයෝජනය කළේය. ඔහු නිරන්තරයෙන් සිය බිරිඳට මුදල් යැවීය. වර්ෂ 2006 දී සෙල්වම් යාපනයට යමින් සිටින අතරතුර අනුරාධපුරයේදී රිය අනතුරකින් මිය ගියේය.

සෙල්වම් පාලනය වූයේ තේසවලමේ නීතියෙන් ද එසේ නැත්නම් සාමාන්‍ය නීතියෙන් ද යන්න මන්දිරා ඔබෙන් විමසයි. ඇයට උපදෙස් දෙන්න.

සෙල්වම්ගේ උපන්ගම ත්‍රිකුණාමලයේ නම් සහ ඔහුගේ පවුල එහි ජීවත් වූයේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේ ද?

04. "පැහැදිලි ලෙසම ලංකාවේ මොහොම්මදික නීතිය භාවිතාවන් මත පදනම්ව ඇති අතර මොහොම්මදික සංග්‍රහය නිශ්ශබ්ද වන අවස්ථා වලදී සහ පෞරාණික සිරිතක් පැවති බව ඔප්පු නොවූ අවස්ථාවලදී අදාලවන නීතිය වූයේ දිවයිනේ පැවති සාමාන්‍ය නීතියයි."

<u>අබ්දුල් රහුමාන් එ. උසාන් උම්මා (1916)</u> 19 න.නී.වා.175 නඩුවේදී ඊනිස් වි. 178 පිටුව.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීරණ ආශ්‍රයෙන් මෙම අධිකරණ වාචිකය විවේචනාත්මකව විභාග කරන්න.

05. "පිරිසිදු හා සරළ රෝම ලන්දේසි නීතිය සම්පූර්ණයෙන්ම මෙම යටත් විජිතය තුළ ක්‍රියාත්මකව නොපැවතුනි. එය විවිධ ආකාරයෙන් අපගේ ව්‍යවස්ථා නීතිය සහ අධිකරණ තීන්දු මගින් ද බොහෝ ආකාරයෙන් වෙනස් කරනු ලැබ ඇත."

කොරොස්ස රබර් සමාගම එ. සිල්වා (1917) 20 න.නී.වා. 65. පිටුව-74 හි වුඩ්රෙන්ටන් වි.

අධිකරණ තීරණ මගින් ඉංග්‍රිසි නීතිය ලංකාවට හඳුන්වා දුන් ආකාරය සම්බන්ධයෙන් මෙම අධිකරණ වාචිතය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

06. "සාමාන්‍ය නීතිය, උඩරට නීතිය හා මුස්ලිම් නීතිය යටතේ විවාහක කාන්තාවක් ස්වාධීන කාන්තාවක ලෙස සලකන නමුදු තේසවලමේ නීතියෙන් පාලනය වන විවාහක කාන්තාවක් තවදුරටත් තම ස්වාමිපුරුෂයාගේ වෛවාහක බලයට යටත් වේ."

- විජයරත්නම් එ. රාජදුරෙයි (1966) 69 න.නී.වා. 146 පිටුව 148 හි තම්බයියා වි.

තේසවලමේ නීතිය යටතේ තම බිරිඳගේ ස්වාධීන දේපළ පාලනය කිරීම සම්බන්ධයෙන් ස්වාමිපුරුෂයෙකු සතු වෛවාහක බලය පිළිබඳ අධිකරණ ආකල්පය ආශ්‍රයෙන් ඉහත අධිකරණ වාචිතය සාකච්ඡා කරන්න.

07. 1973 අංක 74 දරණ යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද අධිකරණ පද්ධතිය සම්බන්ධව සවිස්තරාත්මක සටහනක් ලියන්න.

08. (අ) පූර්ව යටත් විජිත යුගයට පෙර උඩරට රාජධානියේ යුක්තිය පසිඳලීම සම්බන්ධව පහත සඳහන් නිලධාරීන්ට සහ ආයතනවලට පැවරී තිබූ බලතල සාකච්ඡා කරන්න.

1. රජු
2. අධිකාරම්
3. දිසාවේ
4. රට සභාව
5. ගම් සභාව

(ආ) ලන්දේසි යුගයේ පැවති එක් එක් අධිකරණයේ අධිකරණ බලය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම යුගයේදී ඉහළ සිට පහළ දක්වා පැවති අධිකරණ ධූරාවලිය විස්තර කරන්න.

- හිමිකම් ඇවිරිණි. -